# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 8.0

**ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.**

# නිපුණතා මට්ටම - 6.8.2

**දූමින්දාගමනයෙන් ලත් දායාද අගයමින් ඒවා රැක ගැනීමට ක්‍රියා කරයි.**

# පාඩම

**18 ශාසනික දායාද සුරකිමු**

අධ්‍යාපන අමාත්‍යාංශය — ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**විෂය - බුද්ධ ධර්මය** **6 ශ්‍රේණිය**
**නිපුණතාව - 8.0**
**නිපුණතා මට්ටම - 6.8.2**
**පාඩම 18 ශාසනික දායාද සුරකිමු**

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**01**. සඟමිත් තෙරණින් වහන්සේත් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවත් වඩවමන ලද්දේ,

1. වෙසක් පුන් පෝ දිනයි.
2. පොසොන් පුන් පෝ දිනයි.
3. ඇසළ පුන් පෝ දිනයි.
4. උඳුවප් පුන් පෝ දිනයි.

**02**. බෞද්ධ ජනයා ඓතිහාසික ස්ථාන වන්දනා කිරීමේ දී,

1. කැටයම් ස්පර්ශ කොට බැලිය යුතුය.
2. බිත්ති මත කුරුටු ගී ලිවිය යුතුය.
3. චිත්‍ර මත තීන්ත ආලේප කළ යුතුය.
4. නැරඹීමෙන් සතුටු විය යුතුය.

**03**. ලංකාවේ දී පැවිදි වූ ප්‍රථම කාන්තාව වූ අනුලා දේවිය,

1. මිහිඳු මාහිමියන්ගේ සොයුරියයි.
2. දෙවිපියතිස් රජුගේ සොයුරියයි.
3. මහනාග යුව රජුගේ සොයුරියයි.
4. අරිට්ඨ කුමරාගේ සොයුරියයි.

**04**. ලෝකයේ පැරණිම ඓතිහාසික වෘක්ෂය ලෙස සැලකෙන ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ,

1. ශාරීරික චෛතියක් ලෙස සැලකේ.
2. පාරිභෝගික චෛතියක් ලෙස සැලකේ.
3. උද්දේශික චෛතියක් ලෙස සැලකේ.
4. අදෘශ්‍යමාන චෛතියක් ලෙස සැලකේ.

**05**. බෝධි පූජා පැවැත්වීමේ දී සිදුකරනු ලබන චාරිත්‍රයක් වන්නේ,

1. මන්ත්‍ර ආදිය කියා දෙහි කැපීමයි.
2. කන්නලව් කරමින් පොල් ගැසීමයි.
3. සුවඳ පැන්වලින් බෝධිය නැහැවීමයි.
4. කවි ලියා බෝ ශාඛාවල එල්වීමයි.

(ල.05)


අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව
සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06. A කොටසේ කරුණු B කොටසේ කරුණු සමඟ ගළපා අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න.**

<u>**A කොටස**</u>

| | | |
|---|---|---|
| **i.** | අරහත් සඟමිත් තෙරණිය වඩමවාගෙන ඒමට දඹදිවට පිටත්ව ගියේ, ……………….. | ☐ |
| **ii.** | බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට සහ පුද පූජා පැවැත්වීමට පැමිණියේ, ……….…..... | ☐ |
| **iii.** | දුමින්දාගමනය ලෙස හැඳින්වෙන්නේ, ………………………………………..... | ☐ |
| **iv.** | භික්ෂුණීන් වහන්සේලා සඳහා පූජා කරන ලද ආරාමය, ………………………..... | ☐ |
| **v.** | කරවටක් මුහුදේ බැස බෝධීන් වහන්සේ ගෞරවයෙන් පිළිගන්නා ලද්දේ, ………... | ☐ |

(ල.05)

<u>**B කොටස**</u>

a) දේවානම්පියතිස්ස රජතුමා විසිනි.

b) අරිට්ඨ නම් කුමාරයා ය.

c) බෝධි ආගමනයයි.

d) ශිල්ප ශ්‍රේණි 18 ක ජනයා ය.

e) හත්ථාලක මෙහෙණවරයි.

**07. දුමින්දාගමනයෙන් අපට උරුම වූ සංස්කෘතික උරුමයන් රැකීමට කළ යුතු දේවල් පහක් ලියන්න.**

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. ..........................................................................................................................

(ල.05)
(මුළු ලකුණු 20)


අධ්‍යාපන අමාත්‍යාංශය — ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

## 6 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පාඩම 18 - පිළිතුරු

**01.** – 4 **02.** – 4 **03.** – 2 **04.** – 2 **05.** – 3

(ල.05)

**06.** (i) **b** (ii) **d** ( iii) **c** (iv) **e** (v) **a**

(ල.05)

**07.** (1) උපදෙස් අනුවම ඓතිහාසික ස්ථාන නැරඹීම

(2) කලා නිර්මාණවලට හානි නොකිරීම

(3) පැරණි සාහිත්‍ය පොතපත කියවා දැනුම දියුණු කිරීම

(4) උතුම් පුද සිරිත් ඒ අයුරින්ම අනුගමනය කිරීම

(5) පුරාවස්තු ආරක්ෂා කිරීම

(6) ශ්‍රී ලාංකීය ඉතිහාසය හදාරමින් සංස්කෘතික උරුමයන් රැකීමට එකතුවීම

(ආදී සුදුසු කරුණු පහක්)

(මුළු ලකුණු 20)


| | |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | ආගමික හා සාරධර්ම ශාඛාව |

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය